# 2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

## කළුබෝවිල-538



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 538-කළුබෝවිල

## ග්‍රාම සංවර්ධන සැලැස්ම



ආර්ථික සංවර්ධන නිලධාරී

එච්.සී.ලසන්ති මිය

පිටු අංක

# පටුන


**1.** පිහිටීම **01**

**2.** සිතියම **02**

**3.** සාමාජීය හා සංස්කෘතික කරුණු **02**

**4.** යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම

- **i.** මාර්ග **03**
- **ii.** කාණු **04**

**5.** සමාජ සංවර්ධන සැලැස්ම

- **i.** වැඩිහිටියන් සමාජයෙන් හුදෙකලා වීම. **05**
- **ii.** තරුණයින් හා කුඩා ළමයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම. **05**
- **iii.** පාසල් අධ්‍යාපනය පිළිබඳ ගැටලු **06**
- **iv.** දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ ගැටලු **06**
- **v.** සනීපාරක්ෂක ගැටලු **07**
- **vi.** සෞඛ්‍ය හා පෝෂණ ගැටලු **07**
- **vii.** ළමා අපයෝජන පිළිබඳ ගැටලු **07**

**6.** ජීවනෝපාය ව්‍යවසාය සංවර්ධන හා කාන්තා සවිබල සැලැස්ම.

- **i.** වෙළඳපොළ ගැටලු **08**
- **ii.** සාමාජීය හා ආර්ථික ගැටලු **08**

**7.** නිපුණතා සංවර්ධන හා හැකියා සංවර්ධන සැලැස්ම

- **i.** අධ්‍යාපනය ලැබූවන්ට වෘත්තීය කුසලතා පිළිබඳ ගැටල **09**

**8.** කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම

- **i.** ගෙවතු වගාව සම්බන්ධ ගැටලු **10**
- **ii.** විශාල ලෙස වගාවල නියැලෙන පිරිස් **11**

**9.** පරිසර කළමනාකරණ සැලැස්ම

- **i.** අවිධිමත් ලෙස කසල බැහැර කිරීම **12**
- **ii.** ගංවතුර නිසා සිදුවන ආපදා තත්ත්වයන් **12**
- **iii.** ඩෙංගු උවදුර **13**

**10.** ග්‍රාම සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම **14**

## 01.පිහිටීම.


දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වසම් 15කින් සමන්විත වෙයි. එහිදී දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විවිධ ග්‍රාමයන්හී නම් නිර්මාණය වී ඇත ආකාරය පිළිබඳවද විවිධ ජනප්‍රවාදයන් පවතී. 538 කළුබෝවිල යන වසම පිහිටා ඇති ආකාරය පිළිබඳ සඳහන් කිරීමේදී උතුරු දිශාවෙන් විලවල නැගෙනහිරින් දුටුගැමුණු වසමත් දකුණෙන් උද්‍යාන වසමත් බටහිරින් හත්බෝධිය වසමටත් මායිම්ව පිහිටා ඇත. කළුබෝවිල වසම සෑදී ඇති ආකාරය ජනප්‍රවාදයේ සඳහන් වනුයේ දෙහිවල ගාලු පාර කොටස හැර ප්‍රදේශය මැද පිහිටි කොටස භූගෝලීය වශයෙන් හීල් වීදියේ කන්ද නැදිමාලයේ කන්ද ආදී කඳු වළල්ලකින් වටවී තිබූ බවට අදහස් පවතී. මෙම කඳුවලට සම්බන්ධ පොළොව යට කොටසෙහි අඩි කිහිපයක් යනතුරු කබොක් පසක් ද ඉන් අනතුරුව දැවැන්ත කළු ගලක් ද පවතින බව කියවේ. මේ හේතුවෙන් කඳු පාමුල ප්‍රදේශයේ කළුගලින් නිර්මිත ගල් වළවල් පැවති බවත්, එම ගල් වළවල් ජලයෙන් පිරී අඳුරු විල් ලෙස දිස් වූ බවත් ජනප්‍රවාදයේ අදහස් පවතී. බොහෝ කළු විල් සහිත ප්‍රදේශය එනම්, "කළු+බොහෝ+විල" "කළුබෝවිල"ලෙස ප්‍රසිද්ධ වූයේ මේ නිසා බව කියවේ.

538 කළුබෝවිල වසමෙහි විශාලත්වය ගත්විට හෙක්ටයාර් 53.0 වේ. වීදි 10කින් සමන්විත මෙම වසම දකුණු කොලඹ ශික්ෂණ රෝහලට ආසන්නව පිහිටා ඇත. කළුබෝවිල වසමෙහි මුළු ජනගහනය ගත් කළ 5803කුත් ස්ත්‍රී පුරුෂ ලෙස ගත් විට ස්ත්‍රී 2825 හා පුරුෂ 2978ක් ලෙස සටහන් කළ හැක. ජාතින් අනුව ජනගහණය වෙන් කිරීමේදී සිංහල 4122ක් හා දෙමළ 304ක්, මුස්ලිම් 1283, බර්ගර් 48, මැලේ 39 හා අනෙකුත් පිරිස් 07ක් පමණ ජීවත් වේ. එසේම සමෘද්ධි ආධාර ලබන පිරිස 55කුත් පොරොත්තු ලේඛණයේ සමෘද්ධි ආධාර ලැබීමට සුදුසු සංඛ්‍යාව 25 මෙම වසමෙහි ජීවත් වේ.

- **වසමේ මාර්ග**

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම් අංකය | වීදියේ නම | වීදි අංකය |
|---|---|---|---|
| කළුබෝවිල | 538 | ඇන්ඩර්සන් පාර | අංක 2 – 110 දක්වා |
| | | කඩවත පාර | අංක 2 – 68 සී දක්වා |
| | | මංගල පාර | අංක 2 -40 දක්වා සහ 25 සහ 59/1 – 59/7 |
| | | පරාකුම මාවත | අංක 53 – 89 දක්වා |
| | | රත්නාවලි පාර | සියලුම ඔත්තේ සහ ඉරට්ටේ අංක 5-59,10- 56/4 |
| | | ඇලකණ්ඩිය පාර | අංක 99 -117/35 දක්වා |
| | | රෝහල පාර | අංක 1 – 59 දක්වා |
| | | පිරිස් මාවත | අංක 3 – 105 දක්වා |
| | | ප්‍රතිබිම්බාරාම පාර | අංක 1 – 49 දක්වා |
| | | පන්සල පාර | අංක 2 – 40, 1 – 85 දක්වා |

## 02.වසමේ සිතියම




## 03.සාමාජීය හා සංස්කෘතික කරුණු

538 කළුබෝවිල වසම ගත් කළ අධි නාගරික ප්‍රදේශයක් වන අතර තාවකාලික පදිංචිකරුවන් බහුලව ජීවත් වන ප්‍රදේශයකි. එමෙන්ම මෙම වසමෙහි තට්ටු නිවාස බහුලව පවතින ප්‍රදේශයක් වේ. ජාතීන් අනුව ගත්කළ විවිධ ජාතීන් රාශියක් ජීවත්වන ප්‍රදේශයක් වේ. ඒ අතර මුස්ලිම්, සිංහල, දෙමළ, බර්ගර්, මොල්ඩියුස් ආදී මිශ්‍ර ජන කොට්ඨාසයක් දැකිය හැක. එහිදි කළුබෝවිල කොට්ඨාසය තුළ බහුලව ජීවත් වන්නේ සිංහල ජාතිය වන අතර දෙවන පිරිස ලෙස මුස්ලිම් ජනතාව ජීවත් වේ. එසේම කෘෂිකර්මාන්තය අනෙකුත් වසම් සමඟ සැසඳීමේදී වැඩි වපසරියක ව්‍යාප්ත වි ඇත. එහිදී වගුරු බිම් ආශ්‍රිතව ගොඩ ගොවිතැන ඇති අතර එදිනෙදා පරිභෝජනයට හා වානිජ කටයුතු සඳහා ද ගොවිතැන භාවිතා කෙරේ.

එසේම මංගල පාරේ ප්‍රාථමික විදුහලක් වන සාන්ත ජෝන් ප්‍රාථමික විදුහලද පන්සල පාරේ ශ්‍රී සුනන්දාරාම විහාරස්ථානයද පොදු පරිහරණය සඳහා පීරිස් පාරේ පොදු නාන ළිඳක් හා ජයසංබජ්‍ර ළමා උද්‍යානයක්ද රෝහල පාරේ පෑන් ඒෂියා බැංකුව, සෙලාන් බැංකුව ආදි මූල්‍ය ආයතනවලින් වසම පොහොසත් වේ. එමෙන්ම කළුබෝවිල වසමෙහි මාර්ග එනම් ප්‍රධාන මාර්ග 10යම තාර හෝ කාපට කර ඇත. (අතුරු මාර්ග හැර)

විවිධ වූ ජීවනෝපාය ක්‍රම යටතේ තම ජීවිතය පවත්වා ගෙන යන බහු විධ පිරිසක් ජීවත් වන ප්‍රදේශයකි. මහා පරිමාණ ව්‍යාපාරිකයන් හා කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් එසේම ස්වයං රැකියාවල නිරත වන පුද්ගලයන් බහුලව ජීවත්වන ප්‍රදේශයකි.

## 04.යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන සැලැස්ම

### i.මාර්ග

| | |
|---|---|
| ගැටලුව | මාර්ග අබලන් වීම නිසා එදිනෙදා කාර්යයන් සඳහා වැයවන කාලය හා ප්‍රමාදවීම්. වර්ෂා කාලයේදී ජලයෙන් යටවීම නිසා සුළු ගංවතුර ඇති වී නිවාස වලට හානි වීම. |
| අරමුණු | උසස් ප්‍රමිතියෙන් යුත් දීර්ඝ කාලින පැවැත්මක් සහිත මාර්ග පද්ධතියක් සැකසීම. එසේම වර්ෂා කාලයේදි ජගය විධිමත්ව බැස යන ලෙස කාණු පද්ධතිය සැකසීම. |
| උපායමාර්ග | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරී, දෙහි/ගල් මහනගර සභාවේ ප්‍රධාන නාගරික ඉංජිනේරු තාක්ෂණික නිලධාරි, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණික නිලධාරි මඟින් අබලන් මාර්ග පරික්ෂා කර ගැළපෙන ක්‍රමවේදයන් යටතේ දිගුකාලීන පැවැත්මක් තහවුරු වන පරිදි මාර්ග කාණු සංවර්ධනය කිරීම. |
| ක්‍රියාකාරකම | • පන්සල පාර නො 38 ආරම්භ වී 38/1 අවසන් වන මාර්ගය කොන්ක්‍රීට් කිරිම හා එම මාර්ගයේ කාණුව සැකසීම.<br>දිග - 60<br>පළල - අඩි 08<br>සෘජු ප්‍රතිලාභින් - 10<br>වක්‍ර ප්‍රතිලාභින් - 15<br>දැනට පවතින තත්වය - බොරළු පාරකි.<br>වගකීම - දෙ/ගල්මහ නගර සභාව<br><br>• කළුබෝවිල පන්සල පාරේ නො.63/ඒ ආරම්භ වී නො 68/8 අවසන් වන මාර්ගය කොන්ක්‍රීට් කිරීම.<br>දිග - 100 m<br>පළල - අඩි 15<br>සෘජු ප්‍රතිලාභීන් - 25<br>වක්‍ර ප්‍රතිලාභීන් - 250<br>දැනට පවතින තත්වය - තාර දමා ඇති කැඩුණු කොටසකි.<br><br>• පීරිස් පාරේ නො 27 ආරම්භ වී නො 27/2/සී අවසන් වන මාර්ගය කැටගල් ඇල්ලීම<br>දිග - 250 m<br>පළල - අඩි 08<br>සෘජු ප්‍රතිලාභීන් - 300<br>වක්‍ර ප්‍රතිලාභීන් - 500<br>දැනට පවතින තත්වය -<br>වගකීම - දෙ/ගල් මහ නගර සභාව<br><br>• කඩවත පාරේ තුන්වන පටුමග නො.77 ආරම්භ වී නො.34/20 අවසන් වන මාර්ගය කාපට් කිරීම.<br>දිග - 300 m<br>පළල - අඩි 10<br>සෘජු ප්‍රතිලාභීන් - 60<br>වක්‍ර ප්‍රතිලාභීන් - 250<br>දැනට පවතින තත්වය - තාර දමා ඇති කැඩුණු කොටසකි.<br>වගකීම - පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |

| | |
|---|---|
| | • කළුබෝවිල පීරිස් මාවතේ ජයසංබපුර නිවාස යෝජනා ක්‍රමයේ නො.73 නිවස අසල සිට ඇති වට රවුම් මාර්ගය කොන්ක්‍රීට් කිරීම.<br>දිග - 90 m<br>පළල - අඩි 08<br>සෘජු ප්‍රතිලාභීන් - 80<br>වක්‍ර ප්‍රතිලාභීන් - 350<br>වගකීම - දෙ/ගල් මහ නගර සභාව |

## ii.කාණු පද්ධති

| | |
|---|---|
| ගැටලුව | වර්ෂා කාලයේදී කාණු අවහිර වීම නිසා ගංවතුර තත්ත්වයන් ඇති වීම. |
| අරමුණු | උසස් ප්‍රමිතියෙන් යුත් දීර්ඝ කාලීන පැවැත්මක් සහිත කාණු පද්ධතියක් සැකසීම හා වර්ෂා කාලයේදී ජලය විධිමත්ව බැස යන ලෙස කාණු පද්ධති සැකසීම. |
| උපායමාර්ග | ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරි, දෙහි/ගල් මහනගර සභාවේ ප්‍රධාන නාගරික ඉංජිනේරු, තාක්ෂණික නිලධාරි, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණික නිලධාරි මඟින් අබලන් මාර්ග පරික්ෂා කර ගැළපෙන ක්‍රමවේදයන් යටතේ දිගුකාලීන පැවැත්මක් තහවුරු වන පරිදි කාණු සංවර්ධනය කිරීම. |
| ක්‍රියාකාරකම | • වැසි ජලය පාලනය කිරීම සඳහා නො.43න් ආරම්භ වන කළුබෝවිල ප්‍රතිබිම්බාරාම පාර සමාජසේවා විද්‍යාලය අසලින් දිවෙන කාණුව ගැඹුරු කර ඇල මාර්ගය තෙක් භූගත කාණුවක් සැකසීම.<br>දිග - 200 m<br>පළල -<br>සෘජු ප්‍රතිලාභීන් - 15<br>වක්‍ර ප්‍රතිලාභීන් - 250 |
| වගකීම | දෙ/ගල් මහ නගර සභාව |
| | • අංක 538 කළුබෝවිල පන්සල පාරේ ග්‍රාම නිලධාරි කාර්යාලය ඉදිරිපිට ඇති කාණුවෙහි බැඳ නොමැති ඇති පැති බැම්ම සකස් කිරීම.<br>දිග - 250 m<br>පළල - අඩි 10<br>සෘජු ප්‍රතිලාභීන් - 10<br>වක්‍ර ප්‍රතිලාභීන් - 150 |
| වගකීම | වගකීම - දෙ/ගල් මහ නගර සභාව |

## 05.සමාජ සංවර්ධන සැලැස්ම

| | | |
|---|---|---|
| i. | ගැටලුව | වැඩිහිටියන් සමාජයෙන් හුදෙකලාවීමේ දී වයස්ගතභාවයන් සමඟ කායික මානසික සාමාජීය, සෞඛ්‍යමය ලෙස ගැටළු පැන නැගීම. |
| | අරමුණු | වැඩිහිටි ප්‍රජාව සක්‍රීය ක්‍රියාකාරී ප්‍රජාවක් බවට පත්කිරීම. |
| | උපාය මාර්ග | වැඩිහිටි ප්‍රජාව සවිබල කරගැන්වීම සඳහා සමාජ ආරක්ෂක ක්‍රියාකාරකම්වලට සහභාගිවීමට ඉඩ සැලසීම.<br>වැඩිහිටි සමිති සක්‍රීය කිරීම. |
| | ක්‍රියාකාරකම | • වැඩිහිටි සමිති හරහා විනෝදගමන් සංවිධානය කිරිම.<br>• සමාජ සේවා වැඩසටහන් සඳහා වැඩිහිටියන් සම්බන්ධ කරවීම.<br>• වැඩිහිටියන් ගෙවතු වගාව, විසිතුරු මල් වගාව ආශ්‍රිත ස්වයං රැකියා සඳහා යොමු වේ. |
| | වගකීම | සමාජසේවා නිලධාරි<br>ග්‍රාම නිලධාරි<br>සංවර්ධන නිලධාරි<br>සමෘද්ධි නිලධාරි |
| ii. | ගැටලුව | තරුණයන් හා කුඩා ළමයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම. |
| | අරමුණු | තරුණ ළමයින්, කුඩා ළමයින් මත්ද්‍රව්‍යවලින් ගලවා ගැනීම. |
| | ක්රියාකාරකම | • භාවිතා කරන්නන් හා ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳව පසු විපරම් ක්‍රියාවලියක් සිදුකිරිම.<br>• අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය හරහා උපදේශන සේවා ලබාදිම.<br>• සමාජයේ තරුණ පිරිස් හා කුඩා දරුවන්ට දේශන, සම්මන්ත්‍රණ පැවැත්වීම හා පාසල් මට්ටමින් ළමා ප්‍රජාව දැනුවත් කිරීම.<br>• ස්ථාපිත කර ඇති මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු මඟින් භාවිතා කරන පිරිස් හඳුනාගෙන ඔවුන් පුනරුත්ථාපන කටයුතු සඳහා යොමුකිරීම.<br>• මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයන්ගේ යැපෙන්නන් සඳහා ආදායම් මාර්ග හඳුන්වාදීම. (ස්වයං රැකියා) |
| | වගකීම | • අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය<br>• ග්‍රාම නිලධාරි ඇතුළු බිම් මට්ටමේ සිටින නිලධාරින් |

| | | |
|---|---|---|
| **iii.** | ගැටලුව | පාසල් වලට දරුවන් අධ්‍යාපනය සඳහා නැඹුරු කරගැනීමේදි ආකර්ශනීය පාසල් නොවීම හා අඩු අධ්‍යාපනික මට්ටමක් සහිත පවුල්වල දරුවන් අධ්‍යාපනයට නැඹුරු නොවීම. |
| | අරමුණු | ගුණ නැණ බෙලෙන් යුතු විශිෂ්ඨ පුරවැසියෙක් සමාජගත කිරීම. |
| | උපාය මාර්ග | පාසල් සංවර්ධන සමිති, කලාප අධ්‍යාපන කාර්යාල, අධ්‍යාපන අමාත්‍යංශය සමඟ පාසල් සංවර්ධන සැලැස්මක් ඇතිකිරීම. |
| | ක්‍රියාකාරකම | • සාන්ත ජෝන් ප්‍රාථමික විද්‍යාලයේ සුහුරු පන්ති කාමරයක් හා ගණිත කාමරයක් සැකසීම.<br>• සාන්ත ජෝන් ප්‍රාථමික විද්‍යාලයේ පාසල වටා ඇති තාප්පය ප්‍රතිසංස්කරණය කිරීම හා ගේට්ටුව සැකසීම.<br>• සාන්ත ජෝන් ප්‍රාථමික විද්යාලයේ සෙල්ලම් මිදුලට අවශ්‍ය අංගයන් ලබාගැනිම හා සෙල්ලම් මිදුලේ බිමට ආරක්ෂක රබර් වැස්මක් සකස් කරදීම.<br>• සාන්ත ජෝන් ප්‍රාථමික විද්‍යාලයේ ක්රීඩා උපකරණ ලබාදීම හා තූර්ය වාදක භාණ්ඩ ලබාදීම.<br>• සාන්ත ජෝන් ප්‍රාථමික විද්‍යාලය සඳහා මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරයක්, ඩුප්ලෝ යන්ත්‍රයක් හා ඡායා පිටපත් යන්ත්‍රයක් ලබාදිම.<br>• සාන්ත ජෝන් ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රධාන ශාලාව පිළිසකර කිරීම හා ඩෙස් පුටු ලබාදීම. |
| | වගකීම | අධ්‍යාපන අමාත්‍යංශය<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>කලාප අධ්‍යාපන කාර්යාලය |
| **iv.** | ගැටලුව | දහම් පාසල් අධ්‍යාපනය සඳහා දරුවන් නැඹුරුවීමේ ප්‍රවණතාවය අඩු වීම හා දහම් පාසල් ගුරුවරු අඩු වීම. |
| | අරමුණු | දහම් පාසල් අධ්‍යාපනයට දරුවන් නැඹුරු කරගැනිම. යහපත් ගුණගරුක දරුවකු බිහිකිරීම. |
| | ක්‍රියාකාරකම් | • දහම් පාසල් අධ්‍යාපනයේ ඇති වැදගත්කම පිළිබඳ පාසල් මට්ටමින් දරුවන් දැනුවත් කිරීම.<br>• විහාරස්ථාන මඟින් දෙමාපියන් දැනුවත් කිරීම.<br>• කළුබෝවිල ශ්‍රී සම්බුද්ධ ජයන්ති දහම් පාසලේ පවතින දහම් පාසල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම. (වහලය)<br>• ශ්‍රී සම්බුද්ධ ජයන්ති දහම් පාසල සඳහා පවතින වැසිකිළි ප්‍රතිසංස්කරණය කිරීම.<br>• දහම් පාසල් ගුරුවරුන් රජයේ මැදිහත්වීමෙන් බඳවා ගැනිම හා ආකර්ශනීය දීමනාවක් ගෙවීම. |

| | | |
|---|---|---|
| | වගකීම | බෞද්ධ කටයුතු අමාත්‍යාංශය<br>බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී<br>විහාරස්ථානයේ විහාරාධිපති<br>ග්‍රාම නිලධාරි<br>සංවර්ධන නිලධාරි |
| **v.** | ගැටලුව | සනිපාරක්ෂක පහසුකම් නොමැති වීම. |
| | අරමුණ | විධිමත් සනීපාරක්ෂක පහසුකම් ඇතිකිරීම තුළින් සෞඛ්‍ය සම්පන්න පුද්ගලයන් බිහිකිරිම. |
| | ක්‍රියාකාරකම | • වැසිකිලි නොමැති නිවාස සඳහා වැසිකිලි ඉදිකිරීම.<br>• අබලන් තත්වයේ ඇති වැසිකිලි නැවත ඉදිකර ගැනීම සඳහා ද්‍රව්‍ය හා මූල්‍ය ආධාර ලබාදීම.<br>• ආබාධිත අය සිටින පවුල් සඳහා වැසිකිලි සාදා ගැනීමට ආධාර දීම. |
| | වගකීම | සමෘද්ධි සංවර්ධන නිලධාරි<br>සමාජසේවා නිලධාරි<br>ග්‍රාම නිලධාරි<br>සංවර්ධන නිලධාරි |
| **vi.** | ගැටලුව | සෞඛ්‍ය හා පෝෂණ ගැටළු<br>• පාසල් ළමුන්ගේ පෝෂණ වර්ධන ගැටළු<br>• පෙර පාසල් දරුවන්ගේ පෝෂණය පිළිබඳ ගැටළු<br>• අවුරුදු 05ට අඩු, අඩු බර සහිත ළමයින්ගේ පෝෂණ වර්ධන ගැටළු<br>• ගර්භනී මාතාවන්ගේ පෝෂණ ගැටළු |
| | අරමුණ | බල ප්‍රදේශය තුළ පෝෂණ ගැටලු අවම කිරිම හා නීරෝගීමත් සෞඛ්‍ය සම්පන්න පුරවැසියෙක් බිහිකිරිම. |
| | ක්‍රියාකාරකම් | • පාසල් දරුවන්ට හා අනෙකුත් දරුවන්ගේ දෙමාපියන්ට පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.<br>• අඩු බර සහිත දරුවන්ට ත්‍රිපෝෂ ලබාදිම හා එම දෙමාපියන් දරුවන්ට ලබාදියයුතු ආහාර රටා පවුල් සෞඛ්‍ය නිලධාරි මඟින්දැනුවත් කිරීම. |
| 07. | ගැටලුව | වාර්තා ගත නොවන ළමා අපයෝජනයට ලක්වන දරුවන් සිටිම. |
| | අරමුණ | ළමයින්, ළමා හිංසනයෙන් මුදවා ගැනීම. |
| | ක්‍රියාකාරකම | • අවදානම් සහිත දරුවන් හඳුනාගෙන ළමා හා පරිවාස නිලධාරි වෙත යොමුකරමින් උපදේශන ලබාදී ඔවුන් පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකිරීම.<br>• දෙමාපියන් දැනුවත් කර උපදේශන ලබාදිම.<br>• ළමා හා පරිවාස නිලධාරියා හරහා පාසල් මට්ටමින් උපදේශන සේවා ලබාදීම. පාසල් ගුරුවරුන් දැනුවත් කිරීම. |
| | වගකීම | කොහුවල පොලිසියේ ළමා කාන්තා කාර්යංශය<br>පරිවාස හා ළමාරක්ෂක නිලධාරි<br>ග්‍රාම නිලධාරි<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

## 06.ජීවනෝපාය ව්‍යාවසාය සංවර්ධන හා කාන්තා සවිබල සැලැස්ම

| | |
|---|---|
| **01.**ගැටලුව | නිෂ්පාදනය සඳහා වෙළඳපාළ ධාරිතාවය අවම වීම. |
| අරමුණ | පුළුල් නිෂ්පාදන වෙළඳපොළක් ඇතිවීම. |
| උපායමාර්ග | තරඟකාරී නිෂ්පාදන රටාවක් වෙළඳපොළට හඳුන්වා දිම. |
| ක්‍රියාකාරකම | • ආකර්ශනීය නිෂ්පාදන ක්‍රියාවලියක් හඳුන්වා දිම.<br>• නිෂ්පාදන වලට සුදුසු වෙළඳපොළක් අහඳුන්වා දීම<br>• ක්‍රමවත් ඇසුරුම් ක්‍රම පිළිබඳ අවධානය<br>• ප්‍රචාරණය පුළුල් කිරීමේ ක්‍රමවේද හඳුන්වා දීම(ඇසුරුම් කිරීම)<br>• විදාතා සංවර්ධන නිලධාරි සම්බන්ධ කරගෙන පුහුණු වැඩසටහන් වැඩිකිරීම.<br>• මැහුම් උපදේශිකාව සම්බන්ධ කරගෙන පුහුණු වැඩසටහන් ක්‍රියාවට නැංවිම.<br>• කුඩා ව්‍යාපාර නිලධාරි හරහා පුහුණු<br>• ව්‍යාපාර වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් ලබාදීම ගිණුම් පුහුණු ලබාදිම. |
| **02.**ගැටලුව | ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති නිසා සාමාජීය හා ආර්ථික ගැටලු වලින් පීඩා විදීම. |
| අරමුණ | ප්‍රජාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම |
| ක්‍රියාකාරකම | • විදාතා නිලධාරි හරහා ස්වයං රැකියා කරන අයට පුහුණුව ලබාදීම.<br>• පෞද්ගලික හා රාජ්‍ය අංශ රැකියා අවස්ථා හඳුන්වා දිම.<br>• කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි හරහා බැංකු ණය පහසුකම් ලබාදීම. |
| වගකීම | කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි<br>වනිතා සංවර්ධන නිලධාරි<br>විදාතා හා තාක්ෂණ නිලධාරි |

## 07.නිපුණතා සංවර්ධන හා හැකියා සංවර්ධන සැලැස්ම.

| | |
|---|---|
| ගැටලුව | පාසල් අධ්‍යාපනය මඟ හැරුණු හා අඩු අධ්‍යාපනය ලැබුවන් හට වෘත්තීය කුසලතාවය අවම වීම - මෙමඟින් රැකියා ව්‍යුක්තිකයන් හෝ ඌණ සේවා නියුක්තිකයන් නිර්මාණය |
| අරමුණ | තරුණ තරුණයන්ගේ වෘත්තීය නිපුණතාවය ඉහළ නැංවීම හාතරුණ තරුණයින් නව රැකියා අවස්ථා ලබාදිම. |
| ක්‍රියාකාරකම | • වසම තුළ ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවලට යොමුකිරීම. (VTC - දෙහිවල)<br>පල්ලිදොර පාර, කව්ඩාන, දෙහිවල.<br>දු.අ. 0112761964<br>• ප්‍රතිබිම්බාරාම පාරේ ප්‍රතිබිම්බාරාම පන්සල අසල ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය<br>• උසස් අධ්‍යාපනය නොලද අය සඳහා වෘත්තිය මාර්ග උපදේශන පැවැත්වීමෙ හා අසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පාඨමාලා පැවැත්යීම.<br>• පාසල් හැරගියවුවන් හඳුනාගෙන ප්‍රා.ලේ.කාර්යාලයේ නිපුණතා සංවර්ධන නිලධාරි වෙත යොමුකිරීම. |
| වගකීම | නිපුණතා සංවර්ධන නිලධාරි<br>මානව සම්පත් සංවර්ධන නිලධාරි<br>විද්‍යා හා තාක්ෂණ නිලධාරි<br>(ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - දෙහිවල.) |
| කාලය | පාඨමාලා අනුව මාස 3, මාස 06 හා අවුරුද්ද යන ආදී ලෙස වෙනස් වේ. |

## 08.කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම

| | |
|---|---|
| ගැටලුව | ගෙවතු වගාව සඳහා බීජ වර්ග නොමැති වීම. |
| අරමුණ | නාගරික ප්‍රජාව හිතකර ගෙවතු වගාව වර්ධනය කිරිම. |
| උපායමාර්ග | අවම ඉඩකඩකින් වැඩි ඵලදායිතාවයක් සහිත වගා ක්‍රමයක් හා බෝග වර්ග හඳුන්වා දීම. |
| ක්‍රියාකාරකම | • වැඩි ඵලදායිතාවයකින් යුත් දෙමුහුම් බීජ හඳුන්වා දීම.<br>• කෘෂි වගා සහ කෘෂි බෝග වගා පිළිබඳ වැඩසටහන් කෘෂි උපදේශක හරහා පැවැත්වීම.<br>• තිරස් වගාව හඳුන්වා දීම. |
| වගකීම | කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන නිලධාරි<br>ගොවිජන සේවා මධ්‍යස්ථානය - උඩහමුල්ල<br>කෘෂිකර්ම සංවර්ධන නිෂ්පාදන සහකාර |
| ගැටලුව | ගෙවතු වගාව සම්බන්ධව නාගරික ප්‍රජාවගේ ප්‍රවණතාවය අඩුකම (කාර්ය බහුලත්වය) |
| අරමුණ | නාගරික ප්‍රජාව ගෙවතු වගාව කෙරෙහි යොමුකිරීම. |
| ක්‍රියාකාරකම | ගෙවතු වගාකරුවන් හඳුනාගෙන ඔවුන්ව වගා කටයුතු සඳහා පෙළඹවමින් ඒ සඳහා උනන්දු කරවීම.<br>ගෙවතු වගාවේදී රෝග නිවාරණ ක්‍රම හා වැඩි ඵලදාව/ කාබනික පොහොර භාවිතය හා වගා නඩත්තු ක්‍රම පිළිබඳ ශිල්ප ක්‍රම හඳුන්වා දීම. |
| වගකීම | කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන නිලධාරි<br>ගොවිජන සේවා මධ්‍යස්ථානය<br>කෘෂිකර්ම සංවර්ධන නිෂ්පාදන සහකාර |
| ගැටලුව | ගෙවතු වගාව සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම. |
| අරමුණ | තමන්ට ඇති ඉඩ ප්‍රමාණය තුළින් ගෙවතු වගාව සඳහා යොමුකිරීම.<br>(තට්ටු නිවාස, පේළි නිවාස) |
| උපායමාර්ග | කෘෂිකර්ම උපදේශක හා සුදුසු නිලධාරීන්<br>(ග්‍රාම නිලධාරි, සංවර්ධන නිලධාරි, සමෘද්ධි නිලධාරි, කෘෂිකර්ම සංවර්ධන නිලධාරි) හරහා සැලැස්මක් සකස් කිරීම. |
| ක්‍රියාකාරකම | • අඩු ඉඩකඩකින් වගාකළ හැකි ක්‍රමවේද හඳුන්වා දීම.<br>❖ තිරස් වගාව<br>❖ බොන්සායි<br>• කෘෂිකර්ම උපදේශන සේවා ලබාදීම. |
| වගකීම | කෘෂිකර්ම සංවර්ධන නිලධාරි<br>සංවර්ධන නිලධාරි<br>ග්‍රාම නිලධාරි-සමෘද්ධි සංවර්ධන නිලධාරි |


ගෙවතු වගාව

| | ගෙහිමියාගේ නම | ලිපිනය | ඉඩමේ ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ආර්.ඩී.ලිවේරා | නො.03, කඩවත පාර, කළුබෝවිල. | පර්චස් 50 (පෙල) |
| 02. | ඩී. එම්.සෙනෙවිරත්න | නො.57/8, රත්නාවලි පාර, කළුබෝවිල. | පර්චස් 15 (පෙල) |
| 03. | රවීන්ද්‍ර පීරිස් | නො.60/සී, රත්නාවලී පාර, කළුබෝවිල. | පර්චස් 80(පෙල) |
| 04. | එනිල් අරවින්ද | නො.24/25, කඩවත පාර, කළුබෝවිල. | පර්චස් 30(පෙල) |
| 05. | ආරිය රත්න | නො.65/සී, පීරිස් පාර, කළුබෝවිල | පර්චස් 110(පෙල) |
| 06. | සංජීවනී උඩුගම | නො.39/7/එෆ්, පීරිස් පාර, කළුබෝවිල. | පර්චස් 06 |
| 07. | නිහාල් ප්‍රසාද් | නො.60/16, රත්නාවලී පාර, කළුබෝවිල. | පර්චස් 40 (පෙල) |
| 08. | විනීතා ලාලනී | නො.35/1, පීරිස් මාවත, කළුබෝවිල. | පර්චස් 01 |
| 09. | ආරිය නන්දනී | නො.81/6, පන්සල පාර, කළුබෝවිල | පර්චස් 02 |
| 10. | චමින්ද කොස්තා | නො.36, ඇන්ඩර්සන් පාර, කළුබෝවිල. | පර්චස් 10(පෙල) |
| 11. | පී.නාලනී | නො.29/6, අඹගහවත්ත පාර, කළුබෝවිල. | |
| 12. | වසන්ත | නො.48/බී/2, කඩවත පාර, කළුබෝවිල. | |

## 09.පරිසර කළමනාකරණ සැලැස්ම

| | | |
|---|---|---|
| 01. | ගැටලුව | අවිධිමත්ව කුණු කසල බැහැර කිරිම. |
| | අරමුණ | අපද්‍රව්‍ය හා කැලිකසල කළමනාකරණය |
| | ක්‍රියාකාරකම | • කැලිකසල නිසිලෙස ප්‍රමිතිගත කර බඳුන් ගත කිරීම.<br>• කැලි කසල භාරගන්නා ආයතන පුද්ගලයින් හඳුන්වා දීම<br>• කසල කළමනාකරණය පිළිබඳ පරිසර නිලධාරීන් මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාවට නැංවීම. |
| | වගකීම | පරිසර නිලධාරි - ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>ප්‍රජා සංවර්ධන නිලධාරී - දෙහි/ගල් මහ නගර සභාව<br>මහජන සෞඛ්‍ය  පරික්ෂක - නැදිමාල<br>දෙහි/ගල් මහ නගර සභාව |
| 02. | ගැටලුව | ආපදා තත්වය අවම කිරිමේදී වර්ෂා කාලවලදී වැසි ජලයෙන් පාරවල්, ගෙවල් යටවීම. |
| | අරමුණ | නිවාස හා දේපලවල සිදුවන හානිය අවම කිරීම, මාර්ග වලට සිදුවන හානි අවම කිරීම. |
| | ක්‍රියාකාරකම | • කළුබෝවිල පීරිස් මාවත, සුදර්ශි මාවත, පන්සල පාර ගංවතුරෙන් යටවීම වැලැක්විම සඳහා පවතින කුඩා ඇළ හරහා රොන් මඩ ඉවත් කිරිම.<br>• සුදර්ශි මාවතෙහි නො.14 නිවස අසලින් මාර්ගය ඇළ දෙසට උස් විම නිසා වර්ෂා කාලයේදී ජලය ඉක්මනින් ඇළ දෙසට බැස නොයෑම වා ැලැක්වීමට එම පාර ඇළ දෙසට පහත් කර සැකසීම.<br>• 538 ග්‍රාම නිලධාරි කාර්යාලය ඉදිරිපිට ඇති දිය අගල සඳහා බැඳ ඇති බැම්ම නැවත ප්‍රතිසංස්කරණය කිරීම.<br>• සුදර්ශි පාරේ නො.14 නිවස අසල ඇති දිය අගල ගොඩ වී තිබීම නිසා එහි මඩ ඉවත් කිරිම.<br>• ප්‍රතිබිම්බාරාම පාරේ නො. 43 ආරම්භ වන කාණුව ගැඹුරු කිරීම හා සමාජ සේවා විද්‍යාලය අසලින් දිවෙනභූගත කාණුවේ විෂ්කම්භය වැඩිකිරීම.<br>• රත්නාවලි පාරට, කඩවත පාරට, පීරිස් පාරට මායිම පිහිටා ඇති වෙල්යායේ අනවසර ලෙස ඉදිවන ඉදිකිරිම් නැවතීම. |
| 03. | ගැටලුව | ඩෙංගු ව්‍යාප්තිය වැඩිවීම |
| | අරමුණ | ඩෙංගු ව්‍යාප්තිය පාලනය හා අවම කිරීම. |
| | උපායමාර්ග | දෙහි/ගල් මහ නගර සභාව සමඟ සම්බන්ධ වී ඩෙංගු මර්දනය සඳහා වැඩපිළිවෙලක් සකස් කිරිම (මහජන සෞඛ්‍ය පරීක්ෂක, මිහිදුම් බලකාය සමඟ එකතුව) |
| | ක්‍රියාකාරකම | • සෑම විධියක් සම්බන්ධ කරගනිමින් වීදි කමිටු පිහිටුවා ජනතාව දැනුවත් කිරීම.<br>• මහජන සෞඛ්‍ය පරීක්ෂක සම්බන්ධ කරගනිමින් දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම. |

| | | |
|---|---|---|
| | | • ශ්‍රමදාන,ධූමායනය වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• ඉදිකිරීම් හා පොදු ස්ථාන පිරිසිදු කිරීම.<br>• කාණු පද්ධති පිරිසිදු කිරීම. (දෙහි/ගල් මහනගර සභාව මඟින්) |
| | වගකීම | මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>දෙහි/ගල් මහනගර සභාව<br>සෞඛ්‍ය අමාත්‍යාංශය |



**ග්‍රාම සංවර්ධන සැලැස්ම**

කළුබෝවිල වසම

ග්‍රාම සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම

වසම තුළ හඳුනාගත් අවශ්‍යතාවයන් ප්‍රමුඛතාගත කොට ව්‍යුහාත්මක නොවන සංවර්ධන අවශ්‍යතාවන්ට අනුකූලව කළුබෝවිල වසම සඳහා ක්‍රියාකාරී සැලැස්ම පහත පරිදි දැක්විය හැකිය. මෙහිදී මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරිමේදී,

I. ප්‍රජා සහභාගිත්ව පාරිසරික පාදක ඒකාබද්ධ සමානාත්මතා සංවර්ධන ක්‍රියාවලිය
II. දේශීය සම්පත් ගවේෂණය කිරීම හා භාවිතා කිරිම.
III. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව හා ප්‍රධාන ධාරාව
IV. ආපදා අවධානම අවමකිරීම.
V. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි මූලික අවදානය යොමුකර ඇත.

- මෙහිදී සැලසුම් කරන ලද ව්‍යුහාත්මක හා ව්‍යුහාත්මක නොවන ක්‍රියාවන් ස්වයං මූලධර්ම උපරිම ලෙස භාවිතයට ගනිමින් සාර්ථකව ක්‍රියාත්මක කිරීම අත්‍යයින්ම වැදගත්වේ.
- අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සම්පත් සාර්ථක ලෙස බලමුළුගැන්වීම හා උත්පාදන කිරීම.
- අදාල දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ඇති රාජ්‍ය නොවන සංවිධාන, පරිත්‍යාගශීලීන් සම්බන්ධ කරගැනීම.
- දැනටමත් පිහිටුවා ඇති බිම් මට්ටමේ ප්‍රජා ආයතන සහය හා මඟ පෙන්වීම ලබාගැනීම.
- මූල්‍ය හා තාක්ෂණික සම්පත් උපරිම ලෙස භාවිතයට ගැනීමේ ක්‍රමවේදයන් ඒකාබද්ධව සකස් කිරීම.
- මෙහිදි ප්‍රාදේශීය වශයෙන් ලබාගත හැකි ප්‍රජා නායකයින්ගේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය අවශ්‍ය වේ.